**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - 2016**

**-------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සහ 2017 අගෝස්තු 20 දින සංස්ථාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලද ගණුදෙනු පිළිබඳ වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර විගණන මතය සඳහා පදනම**

මාගේ වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 අහිතකර විගණන මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ප්‍රමිතයේ ඡේද අංක 12 ට අනුකූල නොවන ලෙස සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී වාහන හා ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු සඳහා දරන ලද රු.2,109,964 ක වියදම් ප්‍රාග්ධනීත කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39**

ප්‍රමිතයේ 46 ඡේදය අනුව, ස්ථාවර තැන්පතු සාධාරණ වටිනාකමට අගය කර ගිණුම්ගත කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.7,431,000 ක් වූ ස්ථාවර තැන්පතු සාධාරණ අගයට අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව නොපැවති තේ හා අනෙකුත් පැල තවාන් වල වටිනාකම රු.4,364,171 ක් අවසන් තොගයට ඇතුළත් කිරීම හේතුවෙන් එම අගයෙන් අවසන් තොග වටිනාකම අධිතක්සේරු වී තිබුණි.

(ආ) වර්ෂ 05 කට වඩා පැරණි ක්ෂේත්‍රයේ සිටුවිය නොහැකි රු.1,641,197 ක්වූ තේ, රබර් හා අනෙකුත් පැල තවාන් සහ 2013 වර්ෂයේ ගිණිගැනීමෙන් විනාශ වූ රු.1,858,500 ක් වටිනා තේ තොග සමාලෝචිත වර්ෂයේ අවසන් තොගයට ඇතුළත් කිරීම හේතුවෙන් එම අගයෙන් අවසන් තොග වටිනාකම අධිතක්සේරු වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.900,000 ක බදු කුලිය, ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට විලම්භිත වත්කම් ගිණුමට බැරකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා විලම්භිත වත්කම් පිරිවැය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2011 වර්ෂයේදී තැන්පත් කර තිබූ නමුත් ස්ථාවර තැන්පතු යටතේ ගිණුම් ගතකර නොතිබුණු රු.1,000,000 ක් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලබාගෙන තිබුණි. එහෙත් එම වටිනාකම බැරකල යුතු ගිණුම් නිවැරදිව හඳුනාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පාලන ගිණුමකට බැර කිරීම හේතුවෙන් පාලන ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිතකර තිබූ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ පැවති තේ පැල තවාන් හා ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු.1,353,083 ක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා ගෙවා තිබූ රු52,306,107 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායෑමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකමින් ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල රු.8,233,725 ක අයිරා පොළී වියදම් ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම ගිණුම්ගත කිරීමේදී පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමට රු.48,497,486 ක් හර කර ගෙවිය යුතු පාරිතෝෂික ගිණුමට රු.31,868,678 ක් පමණක් බැරකර තිබීම හේතුවෙන් ගෙවිය යුතු පාරිතෝෂික ගිණුමේ ශේෂය රු.16,628,808 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු ශේෂය රු.96,041,073 ක් වූ අතර, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.119,362,386 ක් වීම හේතුවෙන් රු.23,321,313 ක පැහැදිලි නොකල වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර ගිණුම් අනුව වෙළෙඳ හා ගෙවිය යුතු ශේෂය රු.1,229,794,553 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට අනුව එම ශේෂය රු. 1,239,804,480 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.10,009,927 ක වෙනසක් විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| | (රු.) | |
| (අ) ජීව විද්‍යාත්මක වත්කම් | 3,452,008,706 | දැව ගස් තක්සේරු වාර්තා |
| (ආ) ලැබිය යුතු බදු කුලී ආදායම | 15,780,848 | බදු ගිවිසුම් සහ හිඟ බදු කුලී කාල විශ්ලේෂණය |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.150,916,820 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.222,236,596 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.71,319,776 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී විකුණුම් පිරිවැය රු.67,788,918 කින් අඩුවීම ඉහත අලාභය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ අතිරික්තය රු.1,464,302,758 ක් වූ අතර 2013 වර්ෂයේදී එය රු.233,346,559 ක් දක්වා අඩු වී තිබුණි. 2014 හා සමාලෝචිත වර්ෂයේ දී පෙර වර්ෂයට සාපේක්ෂව අතිරික්තයේ සුළු වර්ධනයක් සිදුවී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.256,171,541 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.11,464,302,758 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.256,171,541 ක් දක්වා අඩු වී තිබුණි.